## 377 මා මව්නී

මා මව්නී අති ප්‍රේමණීය
මේ ලෝකේ මගෙ ආධාර
ශෝකේ මා නිති සන්තෝෂය
යාච්ඤාවේ මව සුන්දර

මා යාච්ඤා අසනු දයාවෙන්
මා මව්නී සිට ස්වර්ගයෙන්
ආරක්ෂා කරනු පාපයෙන්
මා මුදා සැම ශෝකයෙන්

අන්ධ වූ අප ආලෝකය
දුර්වල අප ආධාර
පාපි වූ අපගේ පිහිටය
මව් මරී අති පෙම්බර